නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යාංශය

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

තනතුරු පුරප්පාඩු

නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අනු අංකය	තනතුරු නාමය	සේවා මට්ටම	වැටුප් කාණ්ඩය	කල. සේවා අනුමැතිය ලැබී ඇති පුරප්පාඩු සංඛ්‍යාව
1	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)	ජ්‍යෙෂ්ඨ	HM 1-3	1
2	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැලසුම් පර්යේෂණ හා සංවර්ධන)	ජ්‍යෙෂ්ඨ	HM 1-3	1
3	සහකාර සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු සේවා හා ඉදිකිරීම්)	ජ්‍යෙෂ්ඨ	HM 1-1	1
4	සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ)	ජ්‍යෙෂ්ඨ	HM 1-1	1
5	කළමනාකරු (මානව සම්පත් කළමනාකරණ)	ජ්‍යෙෂ්ඨ	MM 1-1	2
6	කළමනාකරු (පරිපාලන)	ජ්‍යෙෂ්ඨ	MM 1-1	25
7	කළමනාකරු (විමර්ශන)	ජ්‍යෙෂ්ඨ	MM 1-1	1
8	කළමනාකරු (සැපයුම්)	ජ්‍යෙෂ්ඨ	MM 1-1	1
9	ගිණුම් නිලධාරී	තෘතීය	JM 1-1	22
10	තාක්ෂණ සහකාර	ද්විතීය	MA 2-2	21
11	තාක්ෂණ සහකාර (විදුලි)	ද්විතීය	MA 2-2	1
12	මුදල් අයකැමි	ද්විතීය	MA 1-2	30
13	විදුලි කාර්මික	ප්‍රාථමික	PL 3	2
14	ලේඛනාගාර භාරකරු	ප්‍රාථමික	PL 1	20
එකතුව				**129**

(වගු අංක 01)

1. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)

බඳවා ගැනීමේ පදනම : ස්ථිර

අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද

බාහිර අයදුම්කරුවන් :-

i. ගණකාධිකරණ, වාණිජ්‍ය හෝ ව්‍යාපාර පරිපාලනය (මූල්‍ය, ගණකාධිකරණය) විෂය ක්ෂේත්‍රයන්ට අදාළව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

හා

ඉහත සඳහන් විෂය ක්ෂේත්‍රයකට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පශ්චාත් උපාධියක් හෝ විෂය ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය (Associate Member) ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ මට්ටමේ තනතුරුවල අවම වශයෙන් වසර 16 ක පළපුරුද්ද ලබා තිබීම.

හෝ

ii. විෂය ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය (Fellow Member) ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ මට්ටමේ තනතුරුවල අවම වශයෙන් වසර 16 ක පළපුරුද්ද ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් :-

i. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

ii. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සමඟ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සේවා ගණයෙහි (HM 1-1) සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය ගිණුම් / කළමනාකාරීත්ව ගිණුම්) තනතුරක අවම වශයෙන් වසර 03 ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

2. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන)

බඳවා ගැනීමේ පදනම : ස්ථිර

අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද

බාහිර අයදුම්කරුවන් :-

සැලසුම්කරණය, පර්යේෂණ හා සංවර්ධනය, කළමනාකරණය, වාණිජ්‍ය, රාජ්‍ය පරිපාලනය, ව්‍යාපාර පරිපාලනය හෝ සංඛ්‍යානය යන විෂය ක්ෂේත්‍රයකින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

හා

ඉහත සඳහන් විෂය ක්ෂේත්‍රයකට අදාළව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පශ්චාත් උපාධියක් හෝ විෂය ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය (Fellow/ Corporate Member) ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ මට්ටමේ තනතුරුවල අවම වශයෙන් වසර 16 ක පළපුරුද්ද ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් :-

i. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

ii. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සමඟ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සේවා ගණයෙහි (HM 1-1) සහකාර සාමාන්‍යාධිකාරී තනතුරක අවම වශයෙන් වසර 03 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

3. සහකාර සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු සේවා හා ඉදිකිරීම්)

බඳවා ගැනීමේ පදනම : ස්ථිර

අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද

බාහිර අයදුම්කරුවන් :-

සිවිල් ඉංජිනේරු හෝ ප්‍රමාණ සමීක්ෂණ යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

හා

විෂය ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය (Fellow/ Corporate Member) ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ මට්ටමේ තනතුරුවල අවම වශයෙන් වසර 13 ක පළපුරුද්ද ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් :-

i. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

ii. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සමඟ විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ සේවා ගණයෙහි (MM 1-3) තනතුරක සේවයේ නියුතුව සිටින සහ කළමනාකරණ සේවා ගණයෙහි තනතුරක වසර 13 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

හෝ

iii. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සමඟ විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ සේවා ගණයෙහි (MM 1-1) I ශ්‍රේණියේ තනතුරක වසර 03 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

4. සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ)

බඳවා ගැනීමේ පදනම : ස්ථිර

අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද

බාහිර අයදුම්කරුවන් :-

තොරතුරු තාක්ෂණ විෂය ක්ෂේත්‍රයට අදාළව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

හා

ඉහත සඳහන් විෂය ක්ෂේත්‍රයකට අදාළව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පශ්චාත් උපාධියක් හෝ විෂය ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය (Fellow/ Corporate Member) ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ මට්ටමේ තනතුරුවල අවම වශයෙන් වසර 13 ක පළපුරුද්ද ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් :-

i. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

ii. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සමඟ විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ සේවා ගණයෙහි (MM 1-3) තනතුරක සේවයේ නියුතුව සිටින සහ කළමනාකරණ සේවා ගණයෙහි තනතුරක වසර 13 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

හෝ

iii. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සමඟ විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ සේවා ගණයෙහි (MM 1-1) I ශ්‍රේණියේ තනතුරක වසර 03 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

5. කළමනාකරු (මානව සම්පත් කළමනාකරණ)

බඳවා ගැනීමේ පදනම : ස්ථිර

අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද

බාහිර අයදුම්කරුවන් :-

i. මානව සම්පත් කළමනාකරණය, රාජ්‍ය පරිපාලනය, ව්‍යාපාර පරිපාලනය, වාණිජ්‍ය හෝ කළමනාකරණය යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධිය ලබා තිබීම.

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක විෂය ක්ෂේත්‍රයට අදාළව අවම වශයෙන් වසර 01 ක පළපුරුද්ද ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් :-

i. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

ii. කනිෂ්ඨ කළමනාකරණ සේවා ගණයේ (JM 1-1) තනතුරක අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

6. කළමනාකරු (පරිපාලන)

බඳවා ගැනීමේ පදනම : ස්ථිර

අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද

බාහිර අයදුම්කරුවන් :-

i. මානව සම්පත් කළමනාකරණය, රාජ්‍ය පරිපාලනය, ව්‍යාපාර පරිපාලනය, වාණිජ්‍ය හෝ කළමනාකරණය යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධිය ලබා තිබීම.

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක විෂය ක්ෂේත්‍රයට අදාළව අවම වශයෙන් වසර 01 ක පළපුරුද්ද ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් :-

i. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

ii. කනිෂ්ඨ කළමනාකරණ සේවා ගණයේ (JM 1-1) තනතුරක අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

7. කළමනාකරු (විමර්ශන)

බඳවා ගැනීමේ පදනම : ස්ථිර

අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද

බාහිර අයදුම්කරුවන් :-

i. රාජ්‍ය පරිපාලනය, ව්‍යාපාර පරිපාලනය, වාණිජ්‍ය, කළමනාකරණය හෝ කලා යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධිය ලබා තිබීම.

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක විෂය ක්ෂේත්‍රයට අදාළව අවම වශයෙන් වසර 01 ක පළපුරුද්ද ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් :-

i. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

ii. කනිෂ්ඨ කළමනාකරණ සේවා ගණයේ (JM 1-1) තනතුරක අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

8. කළමනාකරු (සැපයුම්)

බඳවා ගැනීමේ පදනම : ස්ථිර

අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද

බාහිර අයදුම්කරුවන් :-

i. වාණිජ්‍ය හෝ කළමනාකරණය යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක විෂය ක්ෂේත්‍රයට අදාළව අවම වශයෙන් වසර 01 ක පළපුරුද්ද ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් :-

i. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම් කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

ii. කනිෂ්ඨ කළමනාකරණ සේවා ගණයේ (JM 1-1) තනතුරක අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

MM 1-1 වැටුප් කාණ්ඩයේ තනතුරු සඳහා අතිරේක සුදුසුකම :-

ඉහත සඳහන් MM 1-1 වැටුප් කාණ්ඩයේ එක් එක් තනතුරු වලට අදාළව පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක සාමාජිකත්වය ලබා තිබීම අතිරේක සුදුසුකමක් සේ සැලකේ.

9. ගිණුම් නිලධාරී

බඳවා ගැනීමේ පදනම : ස්ථිර

අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද

බාහිර අයදුම්කරුවන් :-

i. ගණකාධිකරණ, වාණිජ්‍ය, කළමනාකරණය හෝ ව්‍යාපාර පරිපාලනය (මූල්‍ය, ගණකාධිකරණය) විෂය ක්ෂේත්‍රයන්ට අදාළව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

හෝ

ii. ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ/ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ගණකාධිකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව ලබා තිබීම.

හෝ

iii. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ හෝ වෙනත් පොදු රාජ්‍ය මණ්ඩලීය රටක වරලත් ගණකාධිකාරී ආයතනයක අන්තර් මධ්‍ය පරීක්ෂණය හෝ ඊට වඩා ඉහළ පරීක්ෂණයකින් හෝ සමත් වී තිබීම.

හෝ

iv. එක්සත් රාජධානියේ හෝ වෙනත් පොදුරාජ්‍ය මණ්ඩලයීය රටක වරලත් කළමනාකරණ ගණකාධිකාරීත්ව ආයතනයක් මඟින් පවත්වන පිරිවැය සහ කළමනාකරණ පරීක්ෂණයේ I හා II වැනි කොටස් හෝ ඊට වඩා ඉහළ පරීක්ෂණයකින් හෝ සමත් වී තිබීම.

හෝ

v. එක්සත් රාජධානියේ හෝ වෙනත් පොදුරාජ්‍ය මණ්ඩලයීය රටක වරලත් සහතිකලත් ගණකාධිකාරිවරුන්ගේ සංගමයේ මඟින් පවත්වන පරීක්ෂණයේ I හා II වැනි කොටස් හෝ ඊට ඉහළ මට්ටමේ විභාගයකින් සමත් වී තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් :-

i. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

ii. කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන) (MA 1-2) සේවා ගණයේ II ශ්‍රේණියේ කළමනාකරණ සහකාර තනතුරේ අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

10. තාක්ෂණ සහකාර

බඳවා ගැනීමේ පදනම : ස්ථිර

අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද;

බාහිර අයදුම්කරුවන් :-

i. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (5) වැනි මට්ටමට අඩු නොවන්නා වූ ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාළ ප්‍රවීනතා සහතිකය ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් :-

i. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

11. තාක්ෂණ සහකාර (විදුලි)

බඳවා ගැනීමේ පදනම : ස්ථිර

අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද

බාහිර අයදුම්කරුවන් :-

i. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික /වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (5) වැනි මට්ටමට අඩු නොවන්නා වූ විදුලි කාර්මික ශිල්පය පිළිබඳ ප්‍රවීනතා සහතික ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් :-

i. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

12. මුදල් අයකැමි

බඳවා ගැනීමේ පදනම : ස්ථිර

අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද

බාහිර අයදුම්කරුවන් :-

i. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල/ දෙමළ, ගණිතය, ඉංග්‍රීසි භාෂාව යන විෂයයන් ඇතුළුව විෂයයන් 04 කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් 06 කින් සමත්ව තිබීම.

හා

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් 03 ක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

හා

පරිගණක වදන් සැකසුම/ යතුරු ලියනය පිළිබඳ පිළිගත් වෘත්තීය පාඨමාලාවක් හදාරා තිබීම.

අතිරේක සුදුසුකම් :

මුදල් අයකැමි තනතුරේ එක් අවුරුදු සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

අභ්‍යන්තර අයදුම්කරුවන් :-

(අ) ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය සහ ශිල්පීය සේවා ගණයන්හි පහත ආ, 'ඇ' සහ 'ඉ' සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

i. සිංහල/ දෙමළ

ii. ගණිතය

iii. ඉංග්‍රීසි භාෂාව

යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.

හා

පරිගණක වදන් සැකසුම/ යතුරු ලියනය පිළිබඳ පිළිගත් වෘත්තීය පාඨමාලාවක් හදාරා තිබීම.

(ඇ) සේවයේ ස්ථිර පත්වීම් දැරිය යුතු අතර, එම පත්වීම් වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඉ) නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

සටහන් :-

යම් තනතුරකට ස්ථිරව පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇත්නා වූ හෝ යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කිරීම සඳහා කොන්දේසියක් වශයෙන් සේවය කර ඇත්නා වූ පුහුණුවීමේ කාල පරිච්ඡේදයක් ඉහත 'ඉ' ඡේදයෙහි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ. යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇති තාවකාලික/ අනියම් සේවා කාල පරිච්ඡේද ඉහත 'ඉ' ඡේදයෙහි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ.

13. විදුලි කාර්මික

බඳවා ගැනීමේ පදනම : ස්ථිර

අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද

බාහිර අයදුම්කරුවන් :-

i. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාව (NVQ 04) හතරවන මට්ටමට නොඅඩු මට්ටමට සරිලන සේ විදුලි කාර්මික ශිල්පය පිළිබඳ නිපුනතාවයක් සහිතව ඊට අදාළව ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් :-

i. අදාළ ක්ෂේත්‍රයෙහි වසර පහ (05) ක පළපුරුද්ද සහ කාර්මික විද්‍යාලයකින්/ වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ තනතුරෙහි කාර්ය භාරයට අනුකූල වන ජාතික වෘත්තීය කුසලතා (NVQ) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක වෘත්තීය පරීක්ෂණයකින් (Trade Test) සමත් වන ප්‍රාථමික අර්ධ ශිල්පීය (PL 2) හෝ ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1) සේවා ගණයක සේවකයින්.

හෝ

ii. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

14. ලේඛනාගාර භාරකරු

බඳවා ගැනීමේ පදනම : ස්ථිර

අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද

බාහිර අයදුම්කරුවන් :-

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිට විෂයයන් හය (06) කින් සමත් වීම.

ಅಕ್ಷಯ ರಿಪ್ಲೈ ಕರ್ಟೆನ್‌ಗಳು ಮಾ ರಿಮಿಟ

ಕ್ರ.ಸಂ	ಹಾಜರಾದ ಹಾಳೆಗಳು	ರಿಪ್ಲೈಟೆಡ್ ಮಾರ್ಕೆಟಿಂಗ್	ರಿಪ್ಲೈಟೆಡ್ ಸಂಶೋಧಕರು ಅಕ್ಷಯ ರಿಪ್ಲೈಟೆಡ್ (01/2025) ಪಕ್ಷಿ	ರಿಮಿಟ
1	ಕ್ರೀಯಾಟಿವ್ ಮಾರ್ಜಾಲಿಟೆಡ್ (ಪ್ಲಿಂಟ್)	HM 1-3	152.500/- 15 X 4.100/- 214.000/-	ಗಟ್ಟಿಯಿಂದ 35 ರ ಆಂಪಲ್ಲಿ ರಿಮ ಪ್ಲಿಸ. ಗಣಾಹಾರದ ಗಣಮೆಟ್ಟಿಂದರೆ ಬಳಾ ಪಾಲ್ಗೊಂಡ ಮಾಡಿದ ಮಾಡಿದ ಮಾಡಿದ